# දෙවියන්වහන්සේ හඳුනා ගන්නා මාර්ගය

## දෙවියන්වහන්සේ

**පටන්ගැන්මේදී දෙවියන්වහන්සේ අහසත් පොළො වත් මැවූ සේක.**

දෙවියන්වහන්සේ නමැති කෙනෙක් සිටින බව මා දැනගන්නේ කෙසේද? දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාස නොකරන සමහර මනුෂ්‍යයෝ සිටිති. එහෙත් දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාස නොකිරීම නිසා පැන නගින ගැටළු, උන්වහන්සේ කෙරෙහි විශ්වාස කිරීමෙන් ඇති විය හැකි ගැටළුවලට වඩා බර-පතලයි. ජීවනයක් නැති ද්‍රව්‍යයන් තුළින් ජීවනය නිපදවූ බව විශ්වාස කිරීම ඉතා අපහසුයි. උදාහරණයක් වශයෙන් නැවක් ගැන සිතන්න. යම් කෙනෙක් ඔබට ඒ නැව ගැන මෙසේ කථා කරන බව සිතන්න: ‘‘බොහෝ දෙනා සිතන්නේ මේ නැව මනුෂ්‍යයා විසින් සාද ඇති බවයි. නමුත් එසේ නොවේ. යකඩ පොළොවෙන් මතු වී, ඉබේටම එක්කහු වී, ක්‍රමයෙන් මේ නැවේ හැඩයට සැදුණේය. ඒ පිළිවෙලටම එහි යන්ත්‍ර සෑදී, ඒවා නියම තැන්වල

සවි වීය.'' ඔබ සිතන්නේ මේ තැනැත්තා පිස්සෙකු කියාය. මක්නිසාද අප දන්නවා මේ නැව මනුෂ්‍යයන් විසින් සාද ඇති බව. එසේම මේ ලෝකය දෙස බලන විට එය ඉබේට ම සෑදුණු බව පිළිගැනීම ඉතා අමාරුය. එය යම් කෙනෙක් සෑදූ බව අපට පෙනේ. අප ඒ තැනැත්තාට කියන්නේ ''දෙවියන්වහන්සේ'' කියාය. එහෙත් බොහෝ දෙනා කියන්නේ ස්වභාවධර්මය ගැන මිස දෙවියන් වහන්සේ ගැන නොදන්නා බවයි. මනුෂ්‍යයන් දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාස කරතත් නැතත් උන්වහන්සේ වැඩසිටින සේක. බොහෝ දෙනා දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාස නොකරන්නේ උන් වහන්සේ කෙරෙහි විශ්වාස කිරීම දුෂ්කර කාරණ යක් වන නිසා නොවේ. නැත. ඔවුන් එසේ විශ්වාස නොකරන්නේ දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාස කළොත් උන්වහන්සේට අපගේ ජීවිතය ගැන ගණන් දිය යුතු බව පිළිගත යුතු නිසාය. ඔවුන් ''මට දෙවියන්වහන්සේ ගැන විශ්වාස කරන්ට නොහැක'' කියා කටින් කිව්වත්, ඔවුන් සත්‍ය යෙන්ම තමන් තුළ කියන්නේ ''මට දෙවියන් වහන්සේ ගැන විශ්වාස කරන්ට ඕනෑකමක් නැත'' කියාය.

**අඥාණයා, ''දෙවි කෙනෙක් නැතැ''යි සිතින් කීය. ඔවුහු දුශ්චරිතයෙහි සිටිති. ඔවුහු පිළිකුල් ක්‍රියා කළෝය. යහපත කරන්නෙක් නැත.**





# බයිබලය

මේ ලෝකයේ තිබෙන පොත් අතරින් දෙවියන් වහන්සේ විසින් එළිදරව් කර ඇති පොතක් බවට ප්‍රකාශ වී ඇති එකම පොත බයිබලයයි. ඒ පොත උන්වහන්සේ ගැනත්, අප උන්වහන්සේව පුද්ගලිකව දැනගන්නා මාර්ගයත් කියා දෙයි. එනිසා මේ පොතෙන් මනුෂ්‍යයා ගැනත්, පාපය ගැනත්, පාපිෂ්ඨ මනුෂ්‍යයා විසින් මේ ශුද්ධවූ දෙවියන්වහන්සේ දැනගන්නේ කෙසේද කියාත් බලමු.

# මනුෂ්‍යයා

[මනුෂ්‍යයා යන්නෙන් පුරුෂයා සහ ස්ත්‍රිය යන දෙදෙනා අදහස් කරනු ලැබේ.]

දෙවියන්වහන්සේ තමාගේ ස්වරූපයට අනුකූලව පුරුෂයා සහ ස්ත්‍රිය මැවූ සේක. එසේ කියන්නේ දෙවියන්වහන්සේට අපගේ වැනි ශරීරයක් ඇති බව නොවේ. එසේ කියන්නේ උන්වහන්සේ තමාගේ ශුද්ධ පිරිසිදු ස්වභාවයට ගැළපෙන ලෙස මනුෂ්‍යයා සෑදූ බවයි. උන්වහන්සේ මනුෂ්‍යයාව සෑදූවේ පාපය නැතිවයි. මනුෂ්‍යයා පාපයට වැටුණේ කෙසේද කියා අපි බලමු.

# පාපය

දෙවියන්වහන්සේ මනුෂ්‍යයාගේ හික්මවීම සඳහා ව්‍යවස්ථා දුන් සේක. පාපය කියන්නේ ඒ ව්‍යවස්ථා කඩකිරීමටය.

**ස්වාමිවූ දෙවියන්වහන්සේ මනුෂ්‍යයාට ආඥා කරමින්, ''නුඹට උයනේ සියලු ගස්වලින් කැමති ලෙස කන්ට පුළුවන. එහෙත් යහපත සහ නපුර දැනගැනීමේ ගහෙන් කන්ට එපා. මක්නිසාද එයින් කෑ දවසෙහි ඒකාන්තයෙන් නුඹ නසින්නේය''යි කී සේක.**

දෙවියන්වහන්සේ මනුෂ්‍යයාගේ කෑම පිණිස, ඵල දරණ ගස් මැවූ සේක. නමුත් එක ගහක ගෙඩි කෑමට දෙවියන්වහන්සේ මනුෂ්‍යයාට තහනම් කළ සේක. මෙයින් පෙන්වන්නේ දෙවියන්වහන්සේ මනුෂ්‍යයාට යහපත හෝ අයහපත තෝරා ගැනීමට සම්පූර්ණ නිදහස දුන් බවයි. ඒ අණට කීකරු වූවොත් මනුෂ්‍යයාට දෙවියන්වහන්සේ සමඟ සහභාගිකමින් ජීවත්වන්නට පුළුවන. එවිට ඔහුට සැප සම්පත්වලින් පිරුණු ජීවිතයක් ගත කරන්නට හැක. නමුත් ඔහු අකීකරු වූවොත් ඔහු ආත්මිකව මැරෙන්නේය. මෙහි මරණයය කියන්නේ ජීවිතයේ අවසානය නොවේ. මෙහි මරණය යනුවෙන් අදහස් කරන්නේ දෙවියන්වහන්සේගෙන් සදාකාලයටම වෙන්වීමටයි.

**ස්ත්‍රී වනාහි ඒ ගහ කෑමට හොඳ බවද, එය ඇස්වලට ප්‍රිය බවද, නුවණ ලැබීම සඳහා ආශාවිය යුතු ගහක් බවද දැක, එහි ගෙඩි ගෙන කෑවාය. ඈ තමා සමඟ සිටි තමාගේ පුරුෂයාටත් දුන්නාය. ඔහුද කෑවේය.**



අකීකරුකම නිසා පුරුෂයා සහ ස්ත්‍රිය මැරුණේය. එසේ කියන්නේ දෙවියන්වහන්සේ සමඟ තිබූ සහභාගිකමින් ඔවුන් වෙන් වූ බවයි. එදා පටන් මනුෂ්‍යයා පව්කාරයෙකු වුණේය. පාපය කියන්නේ දෙවියන්වහන්සේට විරුද්ධව සහ උන්වහන්සේගේ අණට අකීකරු අන්දමට ජීවත්වන්ට අප තුළ තිබෙන්නාවූ ස්වභාවයටයි.

**එහෙයින් එක් මනුෂ්‍යයෙකු කරණ කොට ගෙන පාපයත්, පාපය කරණ කොට ගෙන මරණයත් ලෝකයට ඇතුල්වුණාක් මෙන්, සියලු මනුෂ්‍යයන් පව් කළ බැවින් සියල්ලන් කෙරෙහි මරණයද පැමුණුණේය.**

**සියල්ලෝම පව් කොට දෙවියන්වහන්සේගේ මහිමයෙන් හීනව සිටිති.**

## පාපයෙන් මිදීම

අපගේ පව් නිසා අප දෙවියන්වහන්සේගෙන් වෙන් වී, මේ ලෝකයේ ජීවත් වෙනවා පමණක් නොව, අපගේ ශාරීරික මරණයට පසුව අප දෙවියන්වහන්සේ ඉදිරියේ සිට අපගේ පව් ගැන උන්වහන්සේට ගණන් දිය යුතුයි.

**එක වරක් මරණයත්, ඉන්පසු විනිශ්චයත් මනුෂ්‍යයන්ට නියමව තිබේ.**

අපගේ පව්වලට සමාව දී, දෙවියන්වහන්සේ සමඟ නැවතත් සහභාගිකම ඇති කොට, අපව මේ විනිශ්වයෙන් මිදීම පිණිස, දෙවියන්වහන්සේ සිය පුත්‍ර යේසුස්වහන්සේ මේ ලෝකයට එවූ සේක. අපගේ පව් නිසා අප විඳිය යුතු දඬුවම උන්වහන්සේ අප වෙනුවෙන් වින්ද සේක. එනිසා අපට උන් වහන්සේ තුළින් පමණක් අපගේ පව්වලට සමාව ලබාගන්ට හැක. උන්වහන්සේ මළවුන්ගෙන් නැගිටි සේක. එනිසා උන්වහන්සේගේ ආත්මයට අප තුළට අවුත්, අපව දෙවියන්වහන්සේ සමඟ එකමුතු කරන්ට හැක.

**දෙවියන්වහන්සේ සිය ඒකජාතක පුත්‍රයාණන් දෙන තරම් අපට ප්‍රේම කළ සේක. එසේ කළේ උන්වහන්සේ කෙරෙහි අදහාගන්නා අය නිරයේ සදකාලයටම විනාශ නොවී, සදකාල ජීවනය ලබන පිණිසයි.**

එහෙත් ඔබගේ පව්වලට සමාව ලබා, දෙවියන් වහන්සේ සමඟ එකමුතුවීම පිණිස ඔබ පහත සඳහන් දේවල් කළ යුතුයි.

1. ඔබ, ශුද්ධවූ දෙවියන්වහන්සේ ඉදිරියේ පව්කාර-යෙකු බව පිළිගත යුතුයි.

2. ඔබ, යේසුස්වහන්සේ ඔබ වෙනුවෙන්, ඔබගේ පව් නිසා ඔබ විඳිය යුතු දඬුවම තමාම වින්ද බව විශ්වාස කළ යුතුයි.



3. ඔබ, ඔබගේ පව් ගැන අවංක ලෙස පසුතැවිලි විය යුතුයි.

4. ඔබ යේසුස්වහන්සේට ඔබගේ ජීවිතයේ පාලනය භාර දිය යුතුයි.

5. ඉන්පසුව, උන්වහන්සේගෙන් ඔබගේ පව්වලට සමාව ඉල්ලා, උන්වහන්සේට ඔබගේ හෘදය සහ ජීවිතය තුළට එන මෙන් ආරාධනා කළ යුතුයි.

යේසුස් ක්‍රිස්තුස් ස්වාමීන්වහන්සේ ඔබට මෙසේ කියන සේක:

**බලන්න, මම ඔබගේ දෙරට (හෘදයට) තට්ටු කරමි. ඔබ මගේ කට හඬ අසා දෙර ඇරියොත් මම ඇතුළට එන්නෙමි.**

**පාපයෙන් වෙහෙස වන්නාවූ, බර උසුලන්නාවූ සියල්ලෙනි, මා වෙතට එන්න. මම ඔබට සහනය දෙමි. මගේ වියගහ නුඹලා පිටට ගෙන, මාගෙන් ඉගෙනගනිල්ලා.**

ඔබටත්, ඔබගේ සම්පූර්ණ ජීවිතය යේසුස් වහන්-සේට පාලනය කිරීම පිණිස දී, උන්වහන්සේව ඔබගේ පුද්ගලික ගැළවුම්කාරයා ලෙස ඔබගේ හෘදය සහ ජීවිතය තුළට පිළිගන්ට කැමැත්තක් තිබෙනවා නම් උන්වහන්සේට මෙසේ කථා කරන්න:

**ආදරනීය යේසුස්වහන්ස, මම පව්කාරයෙකු බව පිළිගනිමි. ඔබවහන්සේ මගේ පව් නිසා මා විඳිය යුතු දඬුවම මා වෙනුවෙන් වින්ද බව මම විශ්වාස කරමි. මම මගේ පව් ගැන අවංක ලෙස පසුතැවිලි වෙමි. ඔබවහන්සේට මගේ ජීවිතයේ සම්පූර්ණ පාලනය දෙමි. මගේ පව්වලට සමාවෙන්න. මගේ හෘදය සහ ජීවිතය තුළට පැමිණ මා තුළ වාසය කරන්න.**

ඔබත් ඔබගේ ජීවිතයේ සම්පූර්ණ පාලනය යේසුස් ක්‍රිස්තුස් ස්වාමීන්වහන්සේට භාර දී, උන්වහන්සේව ඔබගේ පුද්ගලික ගැළවුම්කාරයා ලෙස ඔබගේ හෘදය සහ ජීවිතය තුළට පිළිගත්තා නම් පහත සඳහන් ලිපිනයට ලියන්න.